السنهالية
٢١٨

يا باغي الخير أقبل

# මුස්ලිම් ස්ත්‍රියට ග්‍රන්ථයක්

## كتاب المرأة المسلمة



The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
Tel. 2492727 - fax.2401175 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

# كتاب المرأة المسلمة

أعده وترجمه للغة السنهالية

**شعبة توعية الجاليات بالزلفي**

**الطبعة الأولى: ١٤٢١/٣**

ح شعبة توعية الجاليات بالزلفي ، ١٤٢١هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات بالزلفي

كتاب المرأة المسلمة - الزلفي.

٢٨ ص ؛ ١٢ × ١٧ سم

ردمك : ٩ - ٩١ - ٨١٣ - ٩٩٦٠

(النص باللغة السنهالية)

١- المرأة في الإسلام - ٢ الإسلام والمجتمع

أ- العنوان

ديوي ٢١٩,١ ٢١/١٤٧٥

رقم الايداع ٢١/١٤٧٥

ردمك : ٩ - ٩١ - ٨١٣ - ٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# كتاب المرأة المسلمة

# මුස්ලිම් ස්ත්‍රියට ග්‍රන්ථයක්

## ඉස්ලාමීහි ස්ත්‍රීන්ගේ ස්ථාවරය

ඉස්ලාම් ධර්මය ස්ත්‍රීන් හට ලබාදී ඇති අයිතිවාසිකම් පිළිබඳව දැන ගැනීමට පෙර, සමහර සමාජයන්හි ස්ත්‍රීන්ට හිමිව පවතින ස්ථානය හා ඔවුන් පිළිබඳ ස්ථාවරය පැහැදිලිවම දැන ගැනීම අවශ්‍යවේ.

ග්‍රීක ජාතීන් අතර ස්ත්‍රීන් වෙළඳ භාණ්ඩයක් ආකාරයට පිළි ගනු ලැබූහ. ඔවුන්ට කිසිදු අයිතිවාසිකමක් හිමි නොවූනු අතර, සෑම අයිතිවාසිකමක්ම හිමිවූයේ පිරිමීන්ට පමණි. තවද, ඔවුන්ට (සම්පත් කෙරෙහී) දෙවැනි උරුමයද, මුදල් පරිහරණය කිරීමේ අයිතියද තහනම් වශයෙන් පැවැත්විත. ඔවුන්ගේ ප්‍රකට විද්‍යාඥ යාවූ සෝක්‍රටීස් (Socrates) 'විශ්වයේ භයානක විනාශයට ස්ත්‍රීන් මූලික හේතුවන්නන්ය. ස්ත්‍රිය භාහිරයෙන් සෞන්දර්‍ය අලංකාරයෙන් යුත් විෂ ගසකට සමානයි. එබැවින්, එම ගසෙන් යම්කිසි දෙයක් අනුභව කරන පක්ෂීන් එවිගසම මැරුම් දකිති'. යනුවෙන් තම මතය පලකර ඇත.

රෝම ජාතීන් ස්ත්‍රිය පණ නැති වස්තුවක් ලෙස සිතූහ. ඔවුන් අතර ස්ත්‍රීන්ට කිසියම් වටිනාකමක් හෝ අයිතිවාසිකමක් හෝ නොහිමිවිය. ස්ත්‍රීන් පණ නැති දේ ලෙස ඔවුන් සැළකූ නිසා ඔවුන් ගේ ශරීරය මත උණුකරන ලද තෙල් වැක්කරමින්ද, කුළුනු මත බැඳ තබාද වද කළහ. මෙපමණක් නොව කිසියම් වරදක් හෝ නොකළ ස්ත්‍රීන්ද අශ්වයන්ගේ වලිගයෙහි බැඳ ඔවුන් මරණය දකින තරමට අධික වේගයෙන් ඒවා පදවන්නට වූහ.

ස්ත්‍රීන් පිළිබඳ ඉන්දියානුන්ගේ බැල්මද මෙසේම පැවැත්විනි. නමුත්, ඔවුන් මෙයටත් වඩා ඉහළට ගොස් සැමියෝ නැසී ගියේද, ඔහුගේ චිතකයේම ඔහුගේ බිරිඳද දවන්නට වූහ. තවද, චීන වැසියන්, ස්ත්‍රීන් තම සෞභාග්‍යයන් හා සම්පත් සෝදා ගෙන යන (විනාශ කරන) ජලයට ඔප්පු කළහ. ඔවුන්ට තම බිරිඳයන් පණ පිටින්ම වැළලීමේ හා විකිණීමේ අයිතියද හිමිව තිබිනි.

යුදෙව්වරුන්, ස්ත්‍රීන් සාපයට ලත් අය ලෙස සැළකූහ. කුමක් නිසාදයත්, ඇය නබි ආදම් (අලෛ) තුමා අයහ මගට යොමුකොට (තහනම් කළ) ගසෙන් අනුභව කිරීමට මග පෙන්වූ බවත්, ස්ත්‍රිය ඔසප්වූවිට තිවසද ඇය අල්ලන දේද කිළිටු කරන අපිරිසිදු වන්තියෙකු ලෙසත් සිතූහ. තවද, ඇයට සහෝදරයන් සිටියේද, ඇයට තම පියාගේ ධනයෙන් කිසියම් හිමිකමක් නොලැබෙන බවද සිතූවූහ.

ක්‍රිස්තියානි ජාතීහු, ස්ත්‍රීන්ව ෂෛතාන් (යක්ෂයන්) වශයෙන් සැළකූහ. ක්‍රිස්තියානි ආගමික උගතෙකු 'ස්ත්‍රීන් මිනිස් ජාතියට අයත් නොවන්නන්' බව පැවසීය. තවද, ශුද්ධ. බූනා වෙන්චූර් (St. Buenaventure)යන්නා 'ඔබ ස්ත්‍රියෙක් දුටුවෙනම්, ඇය මිනිස් ජාතියට අයත් තැනැත්තා බව හෝ පණ ඇති දෙය ලෙස හෝ නොසිතන්න. නියතවශයෙන්ම ඔබලා දකින්නේ යක්ෂයාගේ රූපය බවත්, ඔබලා අසා සිටින ඇයගේ කටහඬ සර්පයා ගොරවන ශබ්දය බවත්' පවසන්නේය. තවද, පසුගිය (19 වැනි) සියවසේ මැද භාගය තෙක් ඉංග්‍රීසීන්ගේ සාමාන්‍ය නීතිය අනුව ස්ත්‍රීන් ප්‍රජා අයිතිය ලද අය බව නොසැළකීය. එමෙන්ම ස්ත්‍රීන්ට කිසියම් මිනිස් අයිතිවාසිකම්ද, ඇය පළඳින ඇඳුම් පැළඳුම් ඇතුලු යම්කිසි දෙයකට හෝ උරුමකම්ද ඇයට නොහිමිව තිබිනි.

1567 වන වසරේ ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව (Scottish Parliament) 'ස්ත්‍රීන්ට කිසියම් දෙයකට බලයක් නොදිය යුතුයි' යනුවෙන් නීතියක් පැනවිය. තවද, අටවැනි හෙන්රිගේ (Henry VIII) කාලයේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව (British Parliament)'ස්ත්‍රීන් අපිරිසිදු අය බැවින් බයිබලය පාරායනා නොකළ යුතුයි' යනුවෙන් නීතියක් සම්මත කළේය. ප්‍රංශ ජාතීන් 586 වැනි වසරේ 'ස්ත්‍රීන් මිනිස් ජාතියට අයත්ද, නැද්ද' යනු වෙන් සමීක්ෂණයක් කිරීම සඳහා කමිටුවක් පත් කළහ. මවුහු ස්ත්‍රීන් මිනිස් ජාතියට අයත්වූ නමුත්, මවුන් මවන ලද්දේ පිරිමින්ට ආවතේව කිරීම සඳහා බව තීරණය කළහ. වර්ෂ 1805 දක්වා ඉංග්‍රීසීන්ගේ නීතිය අනුව, සැමියෙකුට තම බිරිඳ විකිණීමේ අයිතිය තිබිත. තවද, බිරිඳගේ වටිනාකම පැන්ස් හයක් එනම්, ෂිලින් භාගය (Six Pence ie Half Shilling) යනුවෙන් නිගමනයද කළහ. *(පැන්ස් හා ෂිලින් යනුවෙන් හැඳින්වන්නේ පැරණි ඉංග්‍රීසි කාසිවල නමය)*

ඉස්ලාම් ධර්මය පැමිණෙන තෙක් අරාබිවරුන් අතරේ ස්ත්‍රීන් නින්දිත වස්තුවක් ලෙසද, සම්පත් හිමිකම් ලැබීමට සුදුස්සන් නොවන අය ලෙසද, කිසිදු සැළකීමක් නොලද අය ලෙසද, මවුන් කිසිදු අයිතිවාසිකම්ද නොමැති අය ලෙසද පිළිගැනීමක් තිබුනි. මෙපමණක් නොව, මවුන්ගෙන් අධික පිරිස් තම දියණියන් පණ පිටින් වළලන්නන් ලෙසද සිටියහ.

මෙකී සැම අපරාධවලින් ස්ත්‍රීන් මුදාහැරීම සඳහාද, ස්ත්‍රීන් හා පිරිමින් සමානවන්නයන් බවත් පිරිමින්ට සේම ස්ත්‍රීන්ටද අයිතිවාසිකම් හිමිව ඇති බවත් පැහැදිලි කිරීම සඳහාද ඉස්ලාම් ධර්මය උදාවිය. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَا أَيُّهَا النَّاسُ إِنَّا خَلَقْنَاكُمْ مِّنْ ذَكَرٍ وَّأُنْثَى وَجَعَلْنَاكُمْ شُعُوْبًا وَّقَبَائِلَ لِتَعَارَفُوْا، إِنَّ أَكْرَمَكُمْ عِنْدَ اللهِ أَتْقَكُمْ﴾ [الحجرات:١٣]

මනුෂ්‍යයණි, නිසැකයෙන්ම අපි ඔබ එක් පිරිමියෙකු හා එක් ස්ත්‍රියෙකු මාර්ගයෙන් මැව්වෙමු. ඔබලාගෙන් එකිනෙකා හඳුනා ගැනීම පිණිස විවිධ ගෝත්‍රයන් හා සමාජයන් ලෙස බිහි කළෙමු. (එහෙයින්) ඔබලාගෙන් කවරෙකු බිය භක්තිකයා ලෙස සිටින්නේද, අල්ලාහ් තආලා වෙත ඉමහත් ගෞරවනීයවන්තයා වන්නේ ඔහුමය. *(අල්කුර්ආන්-49:13)*

﴿وَمَنْ يَّعْمَلْ مِنَ الصَّالِحَاتِ مِنْ ذَكَرٍ أَوْ أُنْثَى وَهُوَ مُؤْمِنٌ فَأُولَئِكَ يَدْخُلُوْنَ الْجَنَّةَ وَلاَ يُظْلَمُوْنَ نَقِيْرًا﴾ [النساء :١٢٤]

එබැවින්, පිරිමින් හෝ ස්ත්‍රීන් හෝ වේවා කවරෙකු විශ්වාසය කර, කුසල් කාර්‍යයන්හි යෙදෙන්නේනම්, ඔවුන් ස්වර්ගයට පිවිසෙති. තවද, ඔවුන් සුළු වශයෙන් හෝ නින්දාවට ලක් නොවෙති. *(අල්කුර්ආන්-4:124)*

﴿وَوَصَّيْنَا الْإِنْسَانَ بِوَالِدَيْهِ حُسْنًا...﴾ [العنكبوت :٨]

තම දෙමාපියන්ට උපකාර (කුසල්) කරන මෙන් අපි මනුෂ්‍යයන්ට අණකර ඇත්තෙමු. *(අල්කුර්ආන්-29:8)* මේ පිළිබඳව නබි මුහම්මදු (සල්) තුමාද මෙසේ පවසන්නේය.

[أَكْمَلُ الْمُؤْمِنِيْنَ إِيْمَانًا أَحْسَنُهُمْ أَخْلاَقًا، وَخِيَارُكُمْ خِيَارُكُمْ لِنِسَائِهِمْ] (الترمذي)

විශ්වාසීන් අතර පරිපූරණ විශ්වාසය තිබෙන්නන් යහපත් ගුණාංගයෙන් සිටින්නන්ය. ඔබ බිරිඳන් අතර ශ්‍රේෂ්ඨවන්තයා, ඔබලා අතර ශ්‍රේෂ්ඨවන්තයාය. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

[سَأَلَ رَجُلٌ النَّبِيَّ ﷺ فَقَالَ: مَنْ أَحَقُّ النَّاسِ بِحُسْنِ صَحَابَتِي ؟ قال : أُمُّكَ، قال ثُمَّ مَنْ ؟ قال : أُمُّكَ، قَالَ: ثُمَّ مَنْ ؟ قال: أُمُّكَ، قال ثُمَّ مَنْ ؟ قال: أَبُوْكَ] (رواه البخاري ومسلم)

පුද්ගලයෙකු නබි මුහම්මදු (සල්) තුමාගෙන් 'මිනිසුන් අතර මිත්‍රත්වය පැවැත්වීමට සුදුස්සා කවරෙකුද?' යනුවෙන් ඇසීය. එයට නබිතුමා 'ඔබේ මවය' යනුවෙන් පැවසීය. පසුව කවරෙකුද? යනුවෙන් ඇසීය. නබිතුමා 'ඔබේ මවය' යනුවෙන් පැවැසීය. පසුව කවරෙකුද? යනුවෙන් ඇසීය. එයටද නබිතුමා 'ඔබේ මවය' යනුවෙන් පැවසීය. පසුව කවරෙකුද? යනුවෙන් නැවත ඇසීය. එයට නබිතුමා 'ඔබේ පියාය' යනුවෙන් පැවසීය. *(බුහාරි හා මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)* මේවා ඉස්ලාම් ධර්මයෙහි ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ කෙටි බැල්මකි.

# ස්ත්‍රීන්ගේ පොදු අයිතිවාසිකම්

ස්ත්‍රීන් අනිවාර්යයෙන් දැනගෙන සිටිය යුතු සමහර පොදු අයිතිවාසිකම් තිබේ. මවුන් ඒවා තමන් කැමැති අවස්ථාවක සම්පූර්ණයෙන් ඉටුකිරීමද සමාජය පිළිගත යුතුයි. එම පොදු අයිතිවාසිකම් මෙසේය.

## 1-සම්පත් සතු කිරීමේ අයිතිය.

ස්ත්‍රීන්හට නිවෙස්, ඉඩම්, කර්මාන්ත ශාලා, වතු, රත්රන්, රිදී හා සිව්පාවන් වැනි කැමැති දෙයක් තම සතු කිරීමේ අයිතිය තිබේ. මවුන් බිරිඳ හෝ මව හෝ දියණිය හෝ සහෝදැරිය හෝ විය හැක.

## 2- විවාහ කිරීමේ අයිතිය.

තමාගේ සැමියාව තෝරා ගැනීම, තමාට කැමැති නොවන අය ප්‍රතික්ෂේප කිරීම හා තමාට හානි සිදුවන අවස්ථාවන්හි දික්කසාදය ලබාගැනීම යනාදී අයිතීන් ස්ත්‍රීන්ට හිමිව ඇත. මේවා ස්ත්‍රීන්ට අයත් ස්ථිර අයිතීන්ය.

## 3-ඉගෙන ගැනීමේ අයිතිය.

අල්ලාහ් පිළිබඳවද, ඔහුට කළ යුතු ඇදහීම් හා එය ඉටුකළ යුතු ක්‍රමද, ඔවුන්ට අනිවාර්යවූ කාර්යයන්ද, ඔවුන්ට අවශ්‍ය සිරිත් විරිත්ද, ශ්‍රේෂ්ඨ ගුණාංගයන්ද යන ඔවුන්ට අනිවාර්යවූ සැම දේ ඉගෙන ගැනීමේ අයිතිවාසිකම ස්ත්‍රීන්ට හිමිව ඇත. මක්නිසාදයත්, අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فَاعْلَمْ أَنَّهُ لاَإِلَهَ إِلاَّاللهُ﴾ [محمد: ١٩]

එබැවින්, නියත වශයෙන්ම වැඳුම් පිදුම් කිරීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොවන බව ඔබ දැන ගන්න. *(අල්කුර්ආන්-47:19)* නබි (සල්) තුමා මෙසේ පවසන්නේය.

[طَلَبُ الْعِلْمِ فَرِيْضَةٌ عَلَى كُلِّ مُسْلِمٍ] (رواه ابن ماجه)

අධ්‍යාපනය ලබාගැනීම සැම මුස්ලිම් පිරිමින් හා ස්ත්‍රීන්ට අනිවාර්ය කරුණක්ය. *(ඉබ්නු මාජා ග්‍රන්ථය ඇසුරෙනි)*

## 4-වියදම් කිරීමේ අයිතිය.

තම මුදලින් තමා කැමැති දේ පිං කිරීමටත්, තමා වෙනුවෙන්ද තම සැමියා, දරුවන් හෝ දෙමාපියන්ගෙන් තමා කැමැති අය වෙනුවෙන්ද නාස්තිය නොවන පරිදි වියදම් කිරීමේ අයිතිය ස්ත්‍රීන්ට තිබේ. මෙම කාර්යයෙහි ස්ත්‍රීන් පිරිමින්ට සමානවේ.

## 5-ප්‍රිය හා අප්‍රියවීමේ අයිතිය.

ඔවුන්ට යහපත් ස්ත්‍රීන් ප්‍රිය කිරීම, ඔවුන් මුන ගැසීම, (ඇයට සැමියා සිටීනම් ඔහුගේ අවසරය මත) තෑගි බෝග පිරිනැමීම, ලිපි යැවීම, ඔවුන්ගේ සැප දුක් විමසීම, ඔවුන්ට දුකක් සිදුවන අවස්ථාවෙහි සැනසුම් කිරීම හා අල්ලාහ් වෙනුවෙන් අයහපත් ස්ත්‍රීන් අප්‍රිය කිරීම, කෝපවීම හා අසතුටුවීම යනාදී අයිතීන් ඇත.

## 6-මරන සාසන අයිතිය.

තම ධනයෙන් තුනෙන් එක කොටසක් තම ජීවිත කාලයේදී අවසන් කැමැති පත්‍රයේ ලිවීම හා එය ඇයගේ මරණයෙන් පසු ප්‍රතික්ෂේපයෙන් තොරව ක්‍රියා කිරීම ඇයගේ අයිතීන්‍ය. මක්නිසාදයත්, අන්තිම කැමැති පත්‍රය ලිවීම සාමාන්‍ය මිනිස් අයිතිවාසිකමකි. මෙය පිරිමින්ට සේ ස්ත්‍රීන්ටද හිමිව ඇත. කුමක්නිසාදයත්, අල්ලාහ්ගෙන් කුසල් ලබා ගැනීම කිසියම් කෙනෙකුට කිසියම් කෙනෙකු වළක්වාලීමට නොහැක. නමුත්, මරන සාසනය තුනෙන් එක පංගුවට වඩා නොවැඩි වීම කොන්දේසියෙකි. මෙහිදී පිරිමින් හා ස්ත්‍රීන් සමානවේ.

## 7-ඇඳුම් පැළඳීමේ අයිතිය.

ස්ත්‍රීන් සේද ඇඳුම් හා රත්රන් පැළඳිය හැක. මේවා පිරිමීන්ට තහනම්ය. ස්ත්‍රියෙක් සිය ඇඳුම් සියල්ලම ගලවා නිර්වස්ත්‍රයෙන්ද, අඩවස්ත්‍රයෙන්ද, කාලවස්ත්‍රයෙන්ද, හිස, උරඇට හා පපුව විවෘතයෙන්ද සිටිය නොහැක. එනමුත් එසේ සිටීමට අවසරය ලද අය සමග පමණක් ඒ ඒ අයගේ ඥාතිකම අනුව (එසේ) සිටීමේ අයිතිය ඇයට ඇත.

## 8-අලංකාර කිරීමේ අයිතිය.

ස්ත්‍රීන්ට තම සැමියන් සඳහා තමාව අලංකාර කර ගැනීමේ අයිතිය හිමිවේ. මවුන් 'සුර්මා' (Kohl) ගෑම, කැමැතිනම්, කම්මුල් දෙක හා තොල් දෙකට රතු පැහැය ආලේප කිරීම, ඉතා ලස්සන ආභරණයන් පැළඳීම යනාදීන් කළ හැක. නමුත්, මුස්ලිම් නොවන ස්ත්‍රීන් හා අකුසල්වන්ත ස්ත්‍රීන්ට සමාන ඇඳුම් පැළඳීම තහනම්ය. සැක හා අකුසල් කාර්යයෙන් ඈත් වීම සඳහා මෙවැනි ඇඳුම් පැළඳිය නොහැක.

## 9-ආහාර පානය කිරීමේ අයිතිය.

රසවත් හා සුවඳ ලත් ආහාර පානයන් අනුභව කිරීමේ අයිතිය ස්ත්‍රීන්ට හිමිවේ. ආහාර පානය කිරීමෙහි ස්ත්‍රී පුරුෂයන්ට කිසිඳු බේදයක් නොමැත. පොදුවෙන් පිරිමින්ට අනුමතවූ සෑම ස්ත්‍රීන්ටද අනුමතවේ. එසේම පිරිමින්ට තහනම්වූ සෑම දේ ස්ත්‍රීන්ටද තහනම්වේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَكُلُوْا وَاشْرَبُوْا وَلاَ تُسْرِفُوْا، إِنَّهُ لاَ يُحِبُّ الْمُسْرِفِيْنَ﴾ [الأعراف : ٣١]

අනුභව කරන්න. පානය කරන්න. නාස්ති නොකරන්න. මක්නිසාදයත්, අල්ලාහ් (සීමා ඉක්මවා) විනාශ කරන්නන් ප්‍රිය නොකරයි. *(අල්කුර්ආන්-7:31)* මෙම ආඥාව ස්ත්‍රී පුරුෂ දෙපිරිසටම පොදුය.

# සැමියාගෙන් බිරිඳගේ අයිතිවාසිකම්

ස්ත්‍රීයෙකුට තම සැමියාගෙන් ලැබිය යුතු පෞද්ගලික අයිතිවාසිකම් තිබේ. මේවා ඇය තමාගේ සැමියාට අනිවාර්යව කළයුතු සමහර පෞද්ගලික යුතුකම් සඳහා ප්‍රතිකාරයවේ. ඒවා අල්ලාහ්ට

හා නබිතුමාට එරෙහි නොවන කාර්‍යයන්හි සැමියාට යටත්වීම, ආහාර පාන පිළියෙලකර දීම, ඔහුගේ ඇතිරිල්ල සකස්කර දීම, ඔහුගේ දරුවන්ට තනකිරි දීම, ඔවුන් ඇතිකිරීම, ඔහුගේ ධනය හා ගෞරවය ආරක්ෂා කිරීම, තම කන්‍යා භාවය රැකීම හා අලං කාර වර්ගයන්හි අනුමතවූ සෑම අලංකාරයන් මගින් තම සැමියා වෙනුවෙන් තමාව අලංකාරකර ගැනීම යනාදීන්ය.

මේවා සියල්ල බිරිඳ තම සැමියාට අනිවාර්‍යයෙන් කළ යුතු වග කීම්ය. අල්ලාහ් මේ ගැන මෙලෙස පවසන්නේය.

﴿وَلَهُنَّ مِثْلُ الَّذِىْ عَلَيْهِنَّ بِالْمَعْرُوْفِ﴾ [البقرة :٢٢٨]

සැමියන්ට බිරිඳන්ගෙන් (ලැබිය යුතු) අයිතිවාසිකම් තිබෙන සේම, නිසි පරිදි බිරිඳන්ටද ඔවුන්ගෙන් (ලැබිය යුතු) අයිතිවාසි කම් තිබේ. *(අල්කුර්ආන්-2:228)*

විශ්වාසනීය ස්ත්‍රීය කිසියම් බියෙන් හෝ ලැජ්ජාවෙන් තොරව තම අයිතිවාසිකම තම සැමියාගෙන් ඉල්ලා ලබාගැනීම සඳහා එම අයිතීන් මෙහි සඳහන්වේ. ඇය සමහරයන් සඳහා සමාව දී ඉවසා ගැනීමෙන් තොරව ඒවා පරිපූර්ණයෙන් බිරිඳට ලබාදීම සැමියාට අනිවාර්‍යවේ. ඇය ඉවසිලිමත් වීමටද හැක.

1-තම පොහොසත් හා අපොහොසත්කම අනුව ඇයට වියදම් කළ යුතුයි. ඇය තමාගේ ඇඳුම් පැළඳුම්, කෑමබීම්, වෙදකම් හා වාසස්ථානය යනාදීන් සඳහා අවශ්‍ය වියදම සැමියාගෙන් ලබා ගත හැක.

2-පිරිමියා ස්ත්‍රීය පාලනය කළ යුතු බැවින් ඇයගේ ගෞරවය, ශරීරය, ධනය, ආගම යනාදියන් ආරක්ෂා කළ යුතුයි. කිසියම් දෙයක් පාලනය කිරීමෙන් හැඳින්වන්නේ, එය සුරකීම හා ආරක්ෂා කිරීමකි.

3-ඇයට අවශ්‍ය ආගමික දැනුම ලබාදිය යුතුයි. ඔහු ඒ සඳහා අපහසුවන්නේද, දේවස්ථාන හෝ පාසැල් හෝ වෙනත් ස්ථානවල පවත්වන ස්ත්‍රීන්ට අයත් ආගමික පන්තිවලට ගොස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ඇයට අවසරය ලබා දිය යුතුයි. එනමුත්, එම ස්ථානයේදි කරදරයන් හා ඔහුට හෝ ඇයට කිසියම් බාධාවන් නොවන ආකාරයට වග බලාගැනීම ප්‍රධාන කොන්දේසියෙකි.

4-ඇය සමග යහපත් ශීලයෙන් හැසිරිය යුතුයි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وَعَاشِرُوْهُنَّ بِالْمَعْرُوْفِ﴾ [النساء: ١٩]

තවද, ඔබලා ඔවුන් සමග ආදරයෙන් (යහපත්ශීල භාවයෙන්) හැසිරෙන්න. *(අල්කුර්ආන්-4:19)*

සංසර්ගයේදී ඇයට අයත් අයිතිවාසිකම පැහැර නොහැරීම, බැණ වැදීමෙන් හෝ පහත්කමින් කථා කිරීමෙන් හෝ වේදනා නොකිරීම හා අවනම්බු නොකිරීම යනාදීන් ඔහුට අයත් යහපත් ශීලයේ ගුණාංගවේය. තවද, ඇය තමාගේ ඥාතීන් මුනගැසීමෙන් කරදරයක් නොවන්නේද, එයින් නොවළක්වා සිටීම, ඇයට කළ නොහැකි කාර්යයන් කෙරෙහි ඇයට ශ්‍රමය නොදීම, කථාවෙන් හා ක්‍රියාවෙන් ඇය සමග කීකරුවෙන් හැසිරීම යනාදීන් යහපත් භාවයෙන් හැසිරීමෙකි. මක්නිසාදයත්, මුහම්මදු නබි (සල්) තුමා මෙලෙස පවසන්නේය.

[خَيْرُكُمْ خَيْرُكُمْ لأَهْلِهِ، وَأَنَاخَيْرُكُمْ لأَهْلِي] (أخرجه الترمذي)

කවරෙකු තම බිරිඳ ඉදිරියේ ශ්‍රේෂ්ඨවන්තයා වන්නේද, ඔබලා අතරේ ශ්‍රේෂ්ඨවන්තයා ඔහුය. ඔබලා අතර, මා මගේ බිරිඳ ඉදිරියේ ශ්‍රේෂ්ඨවන්තයාය. *(තිර්මිති ග්‍රන්ථය ඇසුරෙනි)*

[مَاأَكْرَمَ النِّسَاءَ إِلاَّ كَرِيْمٌ، وَمَا أَهَانَهُنَّ إِلاَّ لَئِيْمٌ]

ඉමහත් යහපත් ශීලවන්තයා ස්ත්‍රීන් සමග යහපත් භාවයෙන් හැසිරෙන්නාය. ඔවුන්ගෙන් ඉමහත් අයහපත් ශීලවන්තයා ඔවුන් සමග අයහපත් භාවයෙන් හැසිරෙන්නාය.

# හිජාබ් පැළඳීම

සත්‍යවශයෙන්ම ඉස්ලාම් ධර්මය පවුල විභිදී නොයා ආරක්ෂා කිරීමට උනන්දුව දක්වයි. එම පවුලෙහි මනෝ ආශාවන් රුකුල් දීමද, ස්වභාවික පරිසරයට හානි වීමද නොවන පරිදී මිනිසුන් ආරෝග්‍යයෙන්ද සමාජයේ පවිත්‍රතාවයෙන්ද ජීවත්වීම උදෙසා ඉස්ලාම් ධර්මය යහපත් ගුණාංගයෙන් හා පිළිවෙලින් යුත් ශක්ති මත් කුළුනු මගින් වට තාප්පය තනා ඇත. කරදරයන් කෙරෙහි අවධානය යොමුකරන කාර්‍යයන් වළක්වාලීම සඳහාද ආවරණය ඇතිකර ඇත. පිරිමින් හා ස්ත්‍රීන් තම බැල්ම පහත් කළ යුතු බවද ඉස්ලාම් ධර්මය ආඥා කරයි.

නිශ්චයවශයෙන්ම අල්ලාහ්, ස්ත්‍රීන්ට හිජාබ් පැළඳීම, ඔවුන්ට ගෞරවයක් වශයෙන්ද, නින්දාවීමෙන් තම කන්‍යාභාවය ආරක්ෂා කර ගැනීම සඳහාද, නපුරු හා අයහපත් ශීලීන්ගෙන් ඔවුන් ඈත් වීම සඳහාද, ඔවුන්ගේ වටිනාකමේ හා මැනීමේ ශ්‍රේෂ්ඨ භාවය නාඳුනන අයගෙන් ආරක්ෂාකර ගැනීම සඳහාද, විෂ බැල්මට හේතුවන ප්‍රශ්නයන්හි දොරටුව වසාගැනීම සඳහාද, ගරුත්ව කුළුණු මගින් ඔවුන්ගේ ගෞරවය හා පතිව්‍රත්ත භාවය රැක ගැනීම සඳහාද අනිවාර්‍ය කරයි.

ඉස්ලාමීය විද්වතුන්, ස්ත්‍රීන් තම බාහුවන් දෙක හා මුහුන හැර ශරීරයේ සියලු අවයවයන් ආවරණය කළයුතු බවත්, ඔවුන්

අන් පිරිමින් අතරෙහි සිටියදී තම අලංකාරයන් නොපෙන්වීම හා තමන් ආවරණ කළයුතු ප්‍රදේශයෙන් ආවරණය ඉවත් නොකළ යුතු බවත් ඒකමතිකව තීරණය කර ඇත. මුහුන හා බාහුවන් ආවරණය කළ යුතුද? නැද්ද? යන්නෙහි විද්වතුන් කොටස් දෙක කට වෙන්වූහ. ඒ ඒ මතවාදීන්ට ඔවුන්ගේ මතයට අවශ්‍ය සාධක යන් ඇත. හිජාබ් පැළඳීම අනිවාර්යවීම ගැනත්, එහි ප්‍රමාණය පිළිබඳවත් අධික ලෙස සාධක තිබේ. ඒ ඒ මතවාදීන් (සාධක යෙහි) එක එක කොටස (තමන්ගේ මතයට) සාධකයන් ලෙස ඉදිරිපත් කරති. තම මතයට නොඔබින ලෙස පවතින දෙය විවිධ කාරණවත් යොදා නිවැරදි කර ගත්හ. අල්ලාහ් පහත සඳහන් වැකි මගින් මෙසේ පවසන්නේය.

﴿وَإِذَا سَأَلْتُمُوهُنَّ مَتَاعًا فَسْئَلُوهُنَّ مِنْ وَرَاءِ حِجَابٍ، ذَالِكُمْ أَطْهَرُ لِقُلُوبِكُمْ وَقُلُوبِهِنَّ﴾ [الأحزاب :٥٣]

ඔබලා නබිතුමාගේ බිරිඳන්ගෙන් කිසියම් දෙයක් අසන්නේද, තිරයෙන් පිටුපස සිට අසන්න. එය ඔබලාගේද ඔවුන්ගේද හෘද යන්ට ඉතාමත් පවිත්‍රකමකි. *(අල්කුර්ආන්-33:53)*

﴿يَا أَيُّهَا النَّبِيُّ قُلْ لأَزْوَاجِكَ وَبَنَاتِكَ وَنِسَاءِ الْمُؤْمِنِيْنَ يُدْنِيْنَ عَلَيْهِنَّ مِنْ جَلاَبِيْبِهِنَّ، ذَالِكَ أَدْنَى أَنْ يُعْرَفْنَ فَلاَ يُؤْذَيْنَ، وَكَانَ اللهُ غَفُوْرًا رَّحِيْمًا﴾ [الأحزاب: ٥٩]

නබිතුමාණෙනි, ඔබ ඔබගේ බිරිඳන්ටද, ඔබගේ දියණියන්ටද, විශ්වාස වන්තයන්ගේ ස්ත්‍රීන්ටද, ඔවුන් තමන්ගේ කබාය (හෝ ශරීරය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි පළඳින ඇඳුම) පැළඳ ගත යුතු බව පවසන්න. මෙය ඔවුන් (ගෞරවනීය ස්ත්‍රීන් යනු වෙන්) හඳුනා ගෙන නින්දා පීඩාවලට නොලක්වී ආරක්ෂාවීමට

යෝග්‍ය (මාර්ග)යෙකි. තවද, අල්ලාහ් ඉමහත් සමාවන්තයා හා කරුණා වන්තයාය. *(අල්කුර්ආන්-33:59)*

﴿وَقُلْ لِّلْمُؤْمِنَاتِ يَغْضُضْنَ مِنْ أَبْصَارِهِنَّ وَيَحْفَظْنَ فُرُوْجَهُنَّ وَلاَ يُبْدِيْنَ زِيْنَتَهُنَّ إِلاَّ مَاظَهَرَ مِنْهَا وَلْيَضْرِبْنَ بِخُمُرِهِنَّ عَلَى جُيُوْبِهِنَّ، وَلاَ يُبْدِيْنَ زِيْنَتَهُنَّ إِلاَّ لِبُعُوْلَتِهِنَّ ...﴾ [النور:٣١]

තවද, (නබිතුමනි) විශ්වාසනීය ස්ත්‍රීන්හට 'මවුන් තමන්ගේ බැල්ම පහත හෙළිය යුතු බවත්, තම ආවරණ ප්‍රදේශ රැක ගත යුතු බවත්, තම දේහ අලංකාරය සාමාන්‍යයෙන් පිටත පෙනෙන දේ හැර අන් කිසිවක් නොපෙන්විය යුතු බවත්, තම පයෝධර සළුවකින් ආවරණය කළ යුතු බවත්, තම සැමියන්ට හැර තම අලංකාර නොපෙන්විය යුතු බවත් පවසන්න'. *(අල්කුර්ආන්-24:31)* නබි මුහම්මදු (සල්) තුමාගේ බිරිඳයෙක්වූ ආයිෂා (රළි) තුමිය පහත සඳහන් පරිදි වාර්තා කරන්නීය.

[كُنَّ النِّسَاءُ يُصَلِّيْنَ مَعَ رَسُوْلِ اللهِ ﷺ الصُّبْحَ فَكَانَ إِذَا سَلَّمَ إِنْصَرَفْنَ مُتَلَفِّعَاتٍ بِمُرُوْطِهِنَّ فَلاَ يُعْرَفْنَ مِنَ الغَلَسِ] (رواه النسائي)

ස්ත්‍රීන් නබි මුහම්මදු (සල්) තුමා සමග ෆජ්ර් සලාතය ඉටුකර මින් සිටියාහ. එතුමා (සලාතය අවසන්කර) සලාම් දීමෙන් පසු එම ස්ත්‍රීන් හිජාබයෙන් තමන් ආවරණය කරමින් පිටත්වන්නට වූහ. එනිසා ඔවුන් අන්ධකාරයෙහි හඳුනාගැනීමට නොහැකිවූහ. *(නසාඉ ග්‍රන්ථය ඇසුරෙනි)*

[كَانَ الرُّكْبَانُ يَمُرُّوْنَ بِنَا، وَنَحْنُ مَعَ رَسُوْلِ اللهِ ﷺ مُحْرِمَاتٌ فَإِذَا حَاذَوْا بِنَا، سَدَلَتْ إِحْدَانَا جِلْبَابَهَا مِنْ رَأْسِهَا عَلَى وَجْهِهَا، فَإِذَا جَاوَزْنَا كَشَفْنَا] (أبوا داود)

අපි මුහම්මදු (සල්) තුමා සමග ඉහ්රාම් (හජ් කර්තව්‍යයට පැළඳින ඇඳුම) පැළඳ ගෙන සිටිනවිට වාහන හිමියන් අපව පසු කර යන්නට වූහ. ඔවුන් අප ඉදිරියට පැමිණෙන විට අප සැම ස්ත්‍රීන්ම මුහුණු වැසුම සිරසෙන් පහත්කර (මුහුණ) වසා ගත් තෙමු. ඔවුන් අපිව පසුකර යාමෙන් පසු අපි මුහුණ විවෘත කර ගත්තෙමු. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

[يَرْحَمُ اللهُ نِسَاءَ الْمُهَاجِرَاتِ الأَوَّلِ، لَمَّا أَنْزَلَ اللهُ تَعَالَى﴿وَلْيَضْرِبْنَ بِخُمُرِهِنَّ عَلَى جُيُوْبِهِنَّ (النور :٣١)﴾ شَقَقْنَ مُرُوْطِهِنَّ فَاخْتَمَرْنَ بِهَا] (رواه البخاري)

ප්‍රථමයෙන් හිජ්රත් ගිය අයගේ බිරිඳන්ට අල්ලාහ් කරුණාව ලබා දෙනු මැනව. මක්කිසාදයන්, 'ඔවුන් තම පයෝධර සළුවකින් ආවරණය කළ යුතුයි' යන වැකිය අල්ලාහ් පහළ කළ විට ඔවුන් තමන්ගේ ඇඳුම ඉරා තම පයෝදර ආවරණය කර ගත්හ. *(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

මෙම කරුණ පිළිබඳ සාධකයන් අධිකව ඇත. නමුත්, හිජාබ් පිළිබඳව මතභේද දරන විද්වතුන් සැමදෙනා ප්‍රශ්න හා කරදර සිදුවේදෝයි කියා බියවන්නේනම්, තම මුහුණ ආවරණය කළ යුතු සේම, රෝගයට ලක්වූ ස්ත්‍රිය වෛද්‍යවරයා හමුවීම වැනි අවශ්‍යතා සඳහා තම මුහුණ විවෘත කළ හැකි බව ඒකමතිකව තීරණය කළහ. ස්ත්‍රීන් තම මුහුණ විවෘත කළ හැකි යනුවෙන් පවසන අයද ඇතුලු සැම දෙනා කලබල ඇතිවේ දැයි බියවන්නේනම්, ස්ත්‍රීන් තම මුහුණු ආවරණය කිරීම අනිවාර්‍ය බව පවසා තිබීම සනාථවී ඇත. කලබලයන් පිරිවරමින් තිබෙන මෙම කාලයට වඩා කලබලයන් පිළිබඳ බිය කුමන කාලයේ ඇතිවේද? නපුරු මිනිසුන් අධිකවූහ. කඩ වීදියේ හා විවිධ තැන්හි ඔවුන් පිරිහී ගැවසෙති. යහපත් ශීලීන් හා ශ්‍රේෂ්ඨවන්තයන් ඌනවූහ.

ඉස්ලාම් ධර්මය ස්ත්‍රීන් අන් පිරිමින් සමග එකට මිශ්‍රණයවී සිටීම තහනම් කළ සේම, ඉහත සඳහන් කරුණු සියල්ල ස්ත්‍රීන් ගේ යහපත් ගුණාංග, පවුල් සැලසුම හා ශ්‍රේෂ්ඨභාවයට ආරක්ෂා වකි. ඉස්ලාම්, ආරක්ෂා කිරීම ගැනද, කලබලයන් හා ඒවායේ දොරටුවන් වසාගැනීම ගැනද උනන්දුවේ. ස්ත්‍රීන් පිට යාම, අන් පිරිමින් සමග මිශ්‍රණයවීම, ගමන් කිරීම යනාදියෙහි මානසික ආශාවන් මතු කිරීම, පාප කරුමයන් කෙරෙහි ආකර්ෂනය ඇති කරන ක්‍රියාවන් පහසු කරවීම, ඒවාහි යෙදෙන්නන්ට ඒවා පහසු ලෙස පෙන්වීම යනාදිය තිබේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وَقَرْنَ فِيْ بُيُوْتِكُنَّ وَلاَ تَبَرَّجْنَ تَبَرُّجَ الْجَاهِلِيَّةِ الأُوْلَى﴾ [الأحزاب :٣٣]

(නබිතුමාගේ බිරියනි) ඔබ ඔබලාගේ නිවෙස්හි රැඳී සිටින්න. පසුගිය අඥාන සමයෙහි (සිටි ස්ත්‍රීන්) මෙන් දේහ අලංකාරය ප්‍රදර්ශනය කරමින් නොඇවිදින්න. *(අල්කුර්ආන්-33:33)*

﴿وَإِذَا سَأَلْتُمُوْهُنَّ مَتَاعًا فَسْئَلُوْهُنَّ مِنْ وَّرَاءِ حِجَابٍ، ذَالِكُمْ أَطْهَرُ لِقُلُوْبِكُمْ وَقُلُوْبِهِنَّ﴾ [الأحزاب :٥٣]

ඔබලා නබි තුමාගේ බිරිඳන්ගෙන් කිසියම් දෙයක් අසන්නේද, තිරයෙන් පිටුපස සිට අසන්න. එය ඔබලාගේද ඔවුන්ගේද හෘද යන්ට ඉතාමත් පවිත්‍රකමකි. *(අල්කුර්ආන්-33:53)*

නබි මුහම්මදු (සල්) තුමා, ඇඳහිමයන් ඉටුකරන තැන් ඇතුලු සෑම තැන්හි පිරිමින් හා ස්ත්‍රීන් එකට මිශ්‍රණයවීම හා එයට තුඩු දෙන කාරනා සියල්ල තරයේම තහනම් කළේය. ස්ත්‍රියෙකු, තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා කිසියම් කෙනෙකු හෝ නොමැති අවස්ථාවක එය ඉටුකර ගැනීමට හෝ තමාට හා තම රැකවරණ යේ සිටින අයගේ ජීවනෝපාය වෙනුවෙන් ගනුදෙනු කිරීමට හෝ

මෙවැනි හේතූන් සඳහා හෝ තමාගේ තිවසෙන් පිටත්වී පිරිමින් සිටින ස්ථානවලට යාමේ අවශ්‍යතාවයට ලක්වන්නේය. එවැනි අවස්ථාවකදී ස්ත්‍රිය ඉස්ලාම් පවසන නීතිරීතීන් අනුව යාමෙන් ප්‍රශ්නයක් නොවන්නේය. එනම්, තම අලංකාර නොපෙන්වන අයුරින් ආවරණය කරමින් ඉස්ලාමීය අලංකාරයෙන් යායුතු අතර, පිරිමින් සමග මිශ්‍රණය නොවන පරිදි වෙන්වී සිටිය යුතුයි.

ස්ත්‍රියෙක් අන් පිරිමියෙකු සමග තනියෙන් සිටීම තහනම් කර තිබීම, ඇයගේ පවුල හා යහපත් ගුණාංගයන් රැකගැනීම සඳහා ඉස්ලාම් ධර්මය යොදා ඇති උතුම් මාර්ගයෙකි. මුහම්මදු (සල්) තුමා, ස්ත්‍රියෙකු තම සැමියා හෝ (විවාහ වීමට නොහැකි) ඥාති යෙකු නොමැති අවස්ථාවක අන් පිරිමියෙකු සමග තනිවම සිටීම ගැන තරයේම අවවාද කරයි. මක්නිසාදයත්, නිශ්චය වශයෙන්ම ෂෛතාන් (යක්ෂයා) ආත්මයන් හා ගුණාංගයන් විනාශ කිරීමෙහි බොහෝ ආශාවෙන් සිටී.

# හයිල් හා නිෆාස් පිළිබඳ නීතිරීතීන්

## හයිල් හි කාලය හා සීමාව

(ස්ත්‍රීන්ගේ මාසික මසප්වීම අරාබියෙන් 'හයිල්' යනු නමින් හැඳින්වේ.)

1-සාමාන්‍යයෙන් ස්ත්‍රීන්ට මසප්වීම සිදුවන්නේ වයස 12 සිට 50 දක්වාවූ කාලය තුලය. සමහර අවස්ථාවක ස්ත්‍රීන් ඔවුන්ගේ ශාරීරික තත්ත්වය අනුව එම වයසට පෙර හෝ පසුව මසප් වීමට හැක. ඒවා විවිධ ආකාරයෙන් පැහැදිලි කර ඇත.

2-මසප්වීමෙහි අඩු හා වැඩි කාලය සඳහා කිසියම් කාල සීමාවන් නොමැත.

## ගර්භනී ස්ත්‍රීන්ගේ ඔසප්වීම

සාමාන්‍යයෙන් ස්ත්‍රියෙකුට ගැබ් ගැනීමෙන් රුධිර පිටත්වීම නවතින්නේය. එනමුත්, ගැබ්වූ ස්ත්‍රිය රුධිරය දුටුවේනම්, එය ප්‍රසූතියට දෙතුන් දිනක් සේ කෙටි කලකට පෙර සිදුවී ප්‍රසූත වේද නාවද තිබේනම් එය නිෆාස් නම්වූ ප්‍රසූත රුධිරයෙකි. ප්‍රසූතියට දීර්ඝ හෝ ස්වල්ප කලකට පෙර සිදුවී ප්‍රසූත වේදනා නොවන්නේ නම්, එය හයිල් (ඔසප්වීම) හෝ නිෆාස් (ප්‍රසූත රුධිරය) හෝ නොමැත. නමුත්, ප්‍රසූතය වන තෙක් නොකඩවා අඛණ්ඩව එය සිදුවන්නේනම්, එය ඔසප්වීම වේ.

## ඔසප්වන සමයේ පිටවන රුධිරය

ස්ත්‍රීන්ට ඔසප්වීම සිදුවන සමයේ විවිධ වර්ග රුධිර පිටත්වේ.

**1-වැඩිවීම හෝ අඩුවීම.**

උදාහරණයක් මෙසේය. ස්ත්‍රියෙකුට සාමාන්‍යයෙන් දින හය කට පමණක සීමාවෙන් ඔසප්වන කාලය දින හතකට දීර්ගවීම හෝ සාමාන්‍යයෙන් දින හතක්වන තෙක් පවතින ඔසප්වීම දින හයකින් නැවතී පිරිසිදුවීම.

**2-නියමිත කාලයට පෙර හෝ පසුව ඇතිවීම.**

උදාහරණයක් මෙසේය. සාමාන්‍යයෙන් සෑම මසක්ම අවසාන යේදී ඔසප්වන ස්ත්‍රිය මාස ආරම්භයේදී හෝ සාමාන්‍යයෙන් සෑම මාසයක්ම ආරම්භයේදී ඔසප්වන ස්ත්‍රිය මාස අවසානයේදී හෝ ඔසප්වීම. කුමන දිනක රුධිරය දකින්නේද, එදිනම ඇය ඔසප්වූ තැනැත්තිය වශයෙන් සැළකේ. කුමන දිනක හෝ එයින් පිරිසිදු වන්නේද, එදිනම ඇය පිරිසිදුවන්තියෙකි. එය සාමාන්‍ය පැවැත් මට නොවන පරිදි වැඩි හෝ අඩුවීමටද පෙර හෝ පසු සිදුවීමටද හැක.

**3-කහ හෝ මිශ්‍රණ පැහැය දැකීම.**

එනම්, තුවාලයෙහි පිටවෙන සැරව ආකාරයට කහ පැහැය හෝ කහ හා කලු මිශ්‍රණ පැහැය අතරෙහි රුධිරය දුටුවෙනම්, (මෙය ඔසප්වනවිට හෝ ඔසප්වීම නැවතී පිරිසිදු වීමට පෙර හෝ සිදුවිය හැක) මෙය ඔසප්වීමකි. මෙයටද ඔසප්වීමෙහි අදාල නීති රීතීන්ම අදාලවේ.

**4-පිළිවෙළක් නොවීම.**

දිනක් රුධිර පිටවී, පසු දින පිරිසිදුවීමට හැකිවන පරිදි ඔසප් වීම වරින්වර සිදුවීම. මේ ස්ථාවරය කෙරෙහි කරුණු දෙකක් ඇත.

අ-ස්ත්‍රීයෙකුට සෑම විටම අඛණ්ඩව රුධිරය පිටත්වීම. මෙය ඉස්තිහාලහ් (අඛණ්ඩව පිටවෙන රුධිරය) යනුවෙන් හැඳින්වේ. මෙසේ රුධිරය දකින ස්ත්‍රීන්ටත් ඉස්තිහාලාහ් තැනැත්තියන්ට අදාල නීතිරීතීන්ම අදාලවේ.

ආ-ස්ත්‍රීයෙකුට වරින්වර රුධිරය පිටත්වීම. එනමුත්, සමහර අවස්ථාවක රුධිරය පිටත්වී පසුව සාමාන්‍ය පිරිසිදුකමට පත්වීම. දිනකට අඩු කාලයක් රුධිරය පිටත්වී (පසුව) එය නවතින්නේද, එය පිරිසිදුවීමක් නොවන්නේය. එනමුත්, දිනකට අඩු කාලයක් රුධිරය පිටත්වී නැවතුනත්, එය පිරිසිදුවීමකි යන්නෙහි ඔප්පු කිරීමේ සාධකයන් තිබේනම්, එනම් ඇයගේ සාමාන්‍ය ඔසප්වීමේ දින අවසානයේ රුධිරය නැවතී පිරිසිදුවන්නේද, හෝ රුධිරය නවතින අවස්ථාවේ සුදු පැහැති දියරයක් ගර්භාෂයෙන් පිටවෙන්නේද එය පිරිසිදු භාවයෙකි.

**5-රුධිරයෙහි වියලි තත්ත්වය.**

ස්ත්‍රීයෙක් තමාට තෙත්වූ යමක් පිටවන බව දකින්නේය. මෙය ඔසප්වී ඇති අවස්ථාවෙහි හෝ පිරිසිදුවීමට මොහොතකට පෙර සිදුවන්නේනම්, එය ඔසප්වීමවේ. පිරිසිදුවීමෙන් පසු සිදුවන්නේ නම්, එය ඔසප්වීම නොවන්නේය.

# ඔසප්වීම පිළිබඳ නීතිරීතීන්

**ඔසප්වීම පිළිබඳ ඉතාමත් අවශ්‍ය සමහර නීතිරීතීන් මෙසේය.**

## 1-අස්සලාත් - නැමදුම

ඔසප්වී සිටින ස්ත්‍රීන්ට අනිවාර්ය (ෆර්ල්) හා කාලීන (සුන්නත්) සලාතයෙහි යෙදීම තහනම්කර ඇත. එසේම යම් නැමදුමක් ඉටු කළ යුතු නියමිත වේලාව තුලෙහි එම නැමදුමෙහි සම්පූර්ණ රක අත් එකක් ඉටුකිරීමට හැකිවන්නේනම්, ඇයට එම නැමදුම ඉටු කිරීම එවිටම අනිවාර්යවේ. එය නැමදුමෙහි ආරම්භ වේලාව හෝ අවසාන වේලාව හෝ විය හැක.

ආරම්භ වේලාවට උදාහරණය.

ඉර බැස ගිය පසු මග්රිබ් සලාතයේ සම්පූර්ණ රකඅත් එකක් ඉටු කරන කාල ප්‍රමාණයකින් පසු ඔසප්වූයේනම්, ඇය පිරිසිදුවී මෙන් පසු එම මග්රිබ් සලාතය ඉටුකළ යුතුයි. කුමක්නිසාදයත්, ඇය ඔසප්වීමට පෙර මග්රිබ් සලාතයේ වේලාවෙහි රකඅත් එකක කාලයක් පිරිසිදුවෙන් සිටියේය.

අවසාන වේලාවට උදාහරණය.

ඉර උදාවීමට පෙර, ෆජ්ර් සලාතයේ රකඅත් එකක් ඉටුකළ යුතු කාලයක් ස්ත්‍රීයෙක් (ඔසප්වීමෙන්) පිරිසිදුවී සිටියේනම්, සම් පූර්ණයෙන් පිරිසිදුවීමෙන් පසු එම ෆජ්ර් සලාතය පසුව ඇය ඉටු කළ යුතුයි. කුමක්නිසාදයත්, ඇය එම සලාතයේ වේලාවෙහි රක අත් එකක කාලයක් පිරිසිදුවෙන් සිටියේය.

සුබ්හානල්ලාහ්, අල්හම්දු ලිල්ලාහ් හා අල්ලාහු අක්බර් යන භාවනාවන් උසුරීමද, ආහාර පාන අනුභව කරන හා අනෙකුත් අවස්ථාවන්හි බිස්මිල්ලාහ් උසුරීමද, ෆික්හු (ආගමික නීතිරීතීන්) හා හදීස් ඉගෙන ගැනීමද, ප්‍රාර්ථනා කිරීමද අල් කුර්අනයට

සවන්දීමද මසප්වූ ස්ත්‍රීන්ට තහනම් නොවන්නේය. එනමුත්, ඇය අල්කුර්ආනය බලමින් හෝ මුවින් නොකියවා හෘදයෙන් සිතමින් පාරායනය කිරීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය. අල් කුර්ආනය හෝ (අල්කුර්ආනය ලියනලද) ලෑල්ල ඉදිරියට තබමින් එය බලා සිතෙන් පාරායනා කිරීම මෙයට උදාහරණයකි. නමුත්, මසප්වූ ස්ත්‍රිය තම අවශ්‍යථාවයෙන් තොරව කුර්ආනය මුවින් පාරායනා නොකර සිටීම උතුම්ය. ඇය සිසුන්ට ඉගැන්විය යුතු ගුරුවරියෙක් වීම හෝ විභාගයක් සඳහා ඉගෙන ගන්නා සිසුවියක් වීම හෝ මෙවැනි අවස්ථාවන් මෙයට උදාහරණවේ.

## 2-අස්සව්ම් – උපවාසයේ යෙදීම

මසප්වූ ස්ත්‍රිය අනිවාර්ය හා අනිවාර්ය නොවන උපවාසයන්හි යෙදීම තහනම්ය. එසේ උපවාසයේ යෙදුනේනම්, එය අවලංගුවේ. එනමුත්, ඒවා අතර අනිවාර්ය උපවාසයන් පසුව නැවත යෙදිය යුතුයි. ඇය උපවාසයේ යෙදී සිටියදී මසප්වූයේනම්, එය ඉර බැසීමට විනාඩියකට පෙර හෝ වේවා එම උපවාසය නිශ්ඵලවේ. එය අනිවාර්ය උපවාසයක්නම්, පසුව එය ඉටුකිරීම අනිවාර්යවේ.

ස්ත්‍රියෙකුට ඉර බැසීමට පෙර මසප්වන බව හැඟවූ නමුත්, ඉර බැසීමෙන් පසුව එය පිටත්වූයේනම්, මෙම අවස්ථාවේ ඇයගේ උපවාසය අවලංගු නොවී සම්පූර්ණවේ. ස්ත්‍රියෙකුට මසප්වීම ඉර (ෆජ්රය) උදාවන විටත් නොනැවතීනම්, ඉර උදාවීමෙන් පසුව විනාඩියක් හෝ ඇය පිරිසිදුවෙන් සිටියද, එදින උපවාසයේ යෙදුනත්, එම උපවාසය පිළිගනු නොලැබේ. ඉර උදාවීමට මොහොතකට පෙර ඇය පිරිසිදුවී උපවාසයේ යෙදුනද, ෆජ්රයට පසුව ස්නානය කළත් ඇයගේ එම උපවාසය වලංගුවේ.

## 3-තවාෆ් (සක්මන්) කිරීම

ඔසප්වී සිටින ස්ත්‍රීන් අනිවාර්ය හා අනිවාර්ය නොවන කිසියම් තවාෆයක් (කාඃබාව සක්මන්) කිරීම තහනම්ය. එසේ කළානම් එය පිළිගනු නොලැබේ. සෆා හා මර්වා කඳුගැට අතර සක්මන් (සඊ) කිරීම, අරෆාවෙහි රැඳී සිටීම, මුස්දලිෆා හා මිනාවෙහි (රාත්‍රියේ) රැඳී සිටීම, ගල් ගැසීම වැනි හජ් හා උම්රාවෙහි ඉතිරි කාර්යයන්හි යෙදීම ඇයට තහනම් නොවන්නේය. මේ අනුව, පිරිසිදුවෙන් සිටින ස්ත්‍රියෙක් තවාෆ් (සක්මන්) කළ විගස හෝ සෆා හා මර්වා අතර සක්මන් කරමින් සිටියදී හෝ ඔසප්වූයේනම්, එයින් ප්‍රශ්නයක් නොවන්නේය.

## 4-මස්ජිදයෙහි රැඳී සිටීම

ඔසප්වී සිටින ස්ත්‍රීන් මස්ජිදය (දේවස්ථානය) තුළෙහි රැඳී සිටීම තහනම් කාර්යයෙකි.

## 5-සංසර්ගයේ යෙදීම

සැමියෙකු ඔසප්වී සිටින තම බිරිඳ සමග සංසර්ගයේ යෙදීම හා බිරිඳ මේ සඳහා ඔහුට අවස්ථාව සලසාදීම තහනම්ය. සංසර්ගයේ යෙදීම හැර තම ආශාව බිඳගැනීම සඳහා සිඹීම, ආලිංගනය කිරීම, රහස් ප්‍රදේශය හැර අන් සැම ස්ථානයන්හි ආශ්වාදය ඇසුරු කිරීම යනාදියන් ඔහුට තහනම් නොවන්නේය.

## 6-දික්කසාද කිරීම

සැමියෙකු තම බිරිඳ ඔසප්වීමෙහි පසුවෙද්දි ඇයව දික්කසාද කිරීම තහනම්ය. මෙසේ සැමියෙකු ඔසප්වී සිටින තම බිරිඳ දික් කසාද කළානම්, ඔහු අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට විරුද්ධකම්

කළ අතර, මහා පාප ක්‍රියාවෙහි යෙදුන්නෙකු වන්නේය. එනිසා, එවිගසම ඔහු (තම තීරණය වෙනස්කර) ඇයව නැවත කැඳවා ගෙන ඇය ඔසප්වීමෙන් පිරිසිදුවන තෙක් තම යටතේ තබා ගැනීම අනිවාර්‍යවේ. පසුව ඔහු කැමැති වන්නේනම්, ඇයව දික්කසාද කළ හැක. එනමුත්, ඇය දෙවැනි වරටත් ඔසප්වන තෙක් ඉවසීමෙන් සිටීම උතුම්ය. එයින් ඇය පිරිසිදු වීමෙන් පසු ඔහු කැමැතිනම්, ඇය සමග ජීවත්වීමටද අකැමැතිනම්, දික්කසාදය වීමටද හැක.

## 7-ජල ස්නානය අනිවාර්‍යවීම

ඔසප්වූ ස්ත්‍රියක් එයින් පිරිසිදුවීමෙන් පසු තම ශරීරය සම්පූර් ණයෙන් පිරිසිදුවන පරිදි ජලස්නානය කිරීම අනිවාර්‍යවේ. තම හිසකෙස් හි යටි පැත්ත දක්වා ජලය යැම වළක්වන සේ ඉතා මත් තදව හිසකෙස් ගොතා ඇත්නම් හැර, අනිවාර්‍ය ජලස්නානය කරනවිට ඇයගේ හිසකෙස් මුදා දැමීම අනිවාර්‍ය නොවන්නේය. ඔසප්වූ ස්ත්‍රියක් යම් සලාතයක වේලාවෙහි පිරිසිදුවූයේනම්, නිය මිත වේලාවට එම සලාතය ඉටු කිරීම සඳහා නොපමනාව ජල ස්නානය කිරීම අනිවාර්‍යවේ.

ඇය ගමනක යෙදී සිටි අවස්ථාවක ජලය නොලැබෙන්නේද, හෝ ජලය ලැබුනද, එය භාවිතා කිරී මෙන් ඇයට යම් බාධාවක් සිදුවේද යනුවෙන් බියවන්නේද, හෝ ඇය රෝගාතුරුව සිටින බැවින් ජලය ඇයට කිසියම් බාධාවක් සිදුකරයිද යනුවෙන් බියවන්නේද, එවිට එම බධාවෙන් මග හැරෙන තෙක් ස්නානය වෙනුවෙන් තයම්මුම් කළ යුතුයි. බාධාවන් මගහැරීමෙන් පසුව ඇය ජල ස්නානය කළ යුතුයි.

# ඉස්තිහාලාහ්

ඉස්තිහාලාහ් යනුවෙන් හැඳින්වන්නේ, ස්ත්‍රියෙකුට (ස්ථිරව හෝ මාස්පතා දිනක් දෙකක් වැනි කෙටි කාලයක් නැවති නැවත) අඛණ්ඩව රුධිරය පිටවීමකි. ස්ත්‍රියගේ සාමාන්‍ය සිරිතට නොවන පරිදි දින පහලොවට වඩා පිටවෙන රුධිරයද ඉස්තිහාලා යනුවෙන් හැඳින්වේ.

## ඉස්තිහාලාහ් හි තත්ත්වයන්

*1 –ඉස්තිහාලාහ්වට පෙර, මසප්වීමෙහි කාලචක්‍රයක් තිබීම*

ඉස්තිහාලාහ්ව (අඛණ්ඩ රුධිරය පිටිවීම)ට පෙර, ස්ත්‍රියෙකුට ස්වභාවයෙන් මසප්වීමෙහි කාල චක්‍රය පැහැදිළිව දැන සිටිය යුතුයි. එසේනම්, ඇය පෙර දැන සිටින මසප්වීමෙහි කාලචක්‍රයට අනුව එකි කාලය සළකා එම කාලයෙහි මසප්වූ අය සේ සිටී. එම කාලයෙහි ඇයට මසප්වුවන්ට අයත් නීතිරීතීන්ම අදාලවේ. එය හැර අන් දිනයන් ඉස්තිහාලාහ්වට අයත්වේ. එයට ඉස්තිහා ලාහ්වෙහි නීතිරීතීන් අදාලවේ.

*2-ඉස්තිහාලාවට පෙර, මසප්වීමෙහි කාලචක්‍රයක් නොතිබීම*

මෙය ස්ත්‍රිය මසප්වීමෙහි රුධිරය දුටු දින සිට ඇයට අඛණ්ඩව රුධිරය පිටවීමකි. මේ අවස්ථාවේදී ඒවා අතරෙහි පවතින වෙනස අනුව ක්‍රියා කළ යුතුයි. ඇයට පිටවෙන රුධිරවල කලු පැහැය, උකුකම හා ගන්ධය යන ස්වභාවය අනුව එය මසප්වීම බවට වටහා ගත යුතුයි. මෙයට මසප්වීමෙහි නීතිරීතීන්ම අදාලවේ. එයට අමතර ස්වභාවයෙන් තිබීම ඉස්තිහාලාහ්වේ. එයට ඉස්ති හාලාහ්ට අයත් නීතිරීතීන්ම අදාලවේ.

මෙයට උදාහරණයක් නම්, ස්ත්‍රියෙක් මසප්වීම දුටු දින සිට තමාට රුධිර පිටත්වීම දකින අතර එය අඛණ්ඩව පිටවීමද දකී. එහෙයින්, ඇය ඒවා අතරෙහි වෙනස අනුව ක්‍රියා කළ යුතුයි. එනම්, එකී රුධිරය මාසයේ මුල් දින දහයෙදී කලු පැහැයෙන් හා ඉතිරි දිනයන්හි රතු පැහැයෙන්ද හෝ මුල් දින දහයේ උකුවටත් ඉතිරි දිනයන්හි දියරුවටත් හෝ මුල් දින දහය මසප්වීමෙහි ගන්ධය සහිතවද ඉතිරි දිනයන්හි ගන්ධය රහිතවද දකී. මෙහි පළමු උදාහරණයෙහි කලු පැහැයද දෙවැනි උදාහරණයෙහි උකුවටද තෙවැනි උදාහරණයෙහි ගන්ධය සහිතවද තිබීම මසප්වීමේ කාලයවේ. මේ දිනයන්ට අමතරව රුධිර පිටවෙන දිනයන් ඉස්තිහාලාහ් කාලයවේ.

### *3-මසප්වීමේ කාලචක්‍රයක්ද පැහැදිළි වෙනසක්ද නොතිබීම*

මෙය ස්ත්‍රියෙකුට මසප්වීමෙහි පැහැදිළි කාල චක්‍රයක් හෝ වෙනසක් නොපැවතීමකි. එනම්, ඇයට මසප්වීමෙහි රුධිරය දුටු ආරම්භ දින සිට අඛණ්ඩව රුධිරය පිටත්වේ. එම රුධිරය එකම තත්ත්වයෙහි හෝ මසප්වීම යනුවෙන් හඳුනාගැනීමට නොහැකි විවිධ තත්ත්වයෙහි පවතින්නේනම්, ඇය ස්ත්‍රීන්ගෙන් වැඩි පිරිසගේ සිරිත අනුව ක්‍රියා කළ යුතුයි. එනම්, ඇයට රුධිරය පිට වීමට පටන්ගත් දින සිට දින හයක් හෝ හතක් මසප්වීමට අදාල දිනයන් ලෙස සැළකිය යුතුයි. මෙම දිනයන්ට අමතරව රුධිරය පිටවෙන දිනයන් ඉස්තිහාලාහ් යනුවෙන් සැළකිය යුතුයි.

# ඉස්තිහාලාහ් පිළිබද නීතිරීතීන්

පිරිසිදුවීමෙහි නීතිරීතීන් ඉස්තිහාලාහ්වටද අදාලවේ. පිරිසිදු වෙන් සිටින හා ඉස්තිහාලාහ්වෙහි සිටින ස්ත්‍රීන්ට පහත සඳහන් කරුණු හැර අන් කිසිදු වෙනසක් නොවන්නේය.

1-සෑම සලාතයක් සඳහාම වුළු (දෝවනය) කිරීම අනිවාර්‍යවේ.
2-දෝවනය කිරීමට අදහස් කරන්නේනම්, රුධිරයෙහි සළකුණ සෝදා ගත යුතු අතර රුධිරය නැවතීම සඳහා තම රහස් ප්‍රදේශයෙහි කපුරෙදි කැබැල්ලක් තබා ගත යුතුයි.

# නිෆාස් හා එහි නීතිරීතීන්

ගර්භනී ස්ත්‍රියගේ දරු ප්‍රසූතියට සම්බන්ධව පිටවෙන රුධිරය නිෆාස් යනුවෙන් හැඳින්වේ. මෙය දරු ප්‍රසූති සමයෙහි හෝ ඊට පසු හෝ ඊට දින දෙක තුනකට පෙර ප්‍රසූතියේ වේදනාව සහිතව හෝ පිටවිය හැක. ස්ත්‍රියෙකුට කෙදින රුධිරය පිටවීම නවතින්නේද, එදිනම ඇය පිරිසිදුවේ. රුධිරය පිටිවීමේ කාල සීමාව දින හතලිහ ඉක්මවා යන්නේද, දින හතලිහකට පසු ජල ස්නානය කළ යුතුයි. කුමක්නිසාදයත්, එය ප්‍රසූති රුධිර වලට අයත් දීර්ග කාල සීමාවකි. රුධිරය අඛණ්ඩව පිටවුවද ප්‍රශ්නයක් නොවන්නේය. නමුත්, දින හතලිහකට පසු පිටවෙන රුධිරය මසප්වීමේ රුධිරය වන්නේනම්, එයින් පිරිසිදුවන තෙක් ඉවසා සිට පසුව ජලස්නානය කළ යුතුයි.

ස්ත්‍රියක් පැහැදිළි ශාරීරික ලක්ෂණ ඇති මිනිස් ජීවයක් ප්‍රසූති කළානම් පමණක් එය ප්‍රසූතියට අයත් රුධිරය බව සැළකේ. එසේ නොවන්නේනම්, (එනම්,) මිනිස් ජීවයක ලක්ෂණයන් පැහැදිළි නොවූ කුඩා ශරීරයක් (හැන උපත) ප්‍රසූති කළානම් එම රුධිරය ප්‍රසූති රුධිරය නොවන්නේය. නමුත්, එය ඉර්ක් යනු (ලේ නහරයෙන් පිටවෙන) ලේ බව සැළකේ. එවිට අඛණ්ඩව රුධිරය (ඉස්තිහාලාහ්) පිටවන අයට අයත් නීතිරීතීන්ම ඇයටත් අදාලවේ. මිනිස් ජීවයෙහි හැඩරුව පැහැදිළිවන අවම කාල සීමාව ගර්භාෂයේ ආරම්භ සිට දින අසූවකි. වැඩීම කාලය දින අනූවකි.

නියතවශයෙන්ම, ඉහත සඳහන් කළ ඔසප්වීම පිළිබඳ නීතිරීතීන් සේම, නිෆාස් (දරු ප්‍රසූතියෙ)හි නීතිරීතියම වලංගුවේ.

## ඔසප්වීම වැළැක්වීම

ස්ත්‍රියකට කොන්දේසි දෙකක් මත ඔසප්වීම වළක්වන උපාය මාර්ගයෙහි යෙදීමට අනුමතකර ඇත.

1-ස්ත්‍රිය එමගින් තමාට හානියක් සිදුවීම ගැන බිය නොවී සිටිය යුතුයි. එසේ බියට පත්වන්නේද, උපායයෙහි යෙදීම තහනම්ය.

2-මෙසේ වළක්වාලීමෙහි සැමියාටද සම්බන්ධතාවයක් තිබේනම් ඔහුගේ කැමැත්ත ලබා ගත යුතුයි.

ඔසප්වීම සඳහා යමක් භාවිතා කිරීම කොන්දේසි දෙකක් මත අනුමතවේ.

1-සැමියාගේ අනුමැතිය.

2-සලාතය, සව්මය හා මෙවැනි අනිවාර්ය කාර්‍යයන් කෙරෙහි ඇත්වී සිටීම සඳහා උපක්‍රමයක් ලෙස නොවීම.

## ගැබ් ගැනීම වළක්වාලීම

ස්ත්‍රීයෙකුට ක්‍රම දෙකක් මත ගැබ් ගැනීම වළක්වාලීමට හැක. ඒවා මෙසේය.

1-ගැබ් ගැනීම මුළුමනින්ම වළක්වාලීම. මෙසේ නොකළ යුතුයි.

2-කිසියම් කාල සීමාවක් දක්වා තාවකාලිකව ගැබ් ගැනීම වළක් වාලීම. උදාහරණයක්නම්, ස්ත්‍රියක් අඛණ්ඩව ගැබ්වීම හා එසේ ගැබ්වීමෙන් ඇය අසීරුතාවයට පත්වන්නේද, වසර දෙක කට හෝ මෙවැනි කාල සීමාවකට තමා ගැබ් ගැනීම පිළියෙල කළ හැක. තම සැමියාගේ අවසරය හා තමාට කිසිදු හානි යක් මෙමගින් නොසිදුවීම යන කොන්දේසි මත මෙසේ කර ගැනීම අනුමතවේ.

## محتويات الكتاب

مكانة المرأة في الإسلام

حقوق المرأة العامة

حقوق المرأة على زوجها

حكم الحجاب

أحكام الحيض والنفاس والاستحاضة

نصائح للمرأة المسلمة

## මෙම පොත තුල

ඉස්ලාමිහී ස්ත්‍රියගේ ස්ථාවරය
ස්ත්‍රීන්ගේ පොදු අයිතිවාසිකම්
සැමියාගෙන් බිරිඳගේ අයිතිවාසිකම්
හිජාබ් පැළඳීම
ප්‍රශව සහ ඔසප් සම්බන්ධ නීති
මුස්ලිම් කාන්තාවට ඔවදන්

**للمساهمة في طباعة الكتاب**

**شركة الراجحي - ٢٠٤٠١٠٩٠٩٢**

**المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي الروضة بالرياض**

**تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد**

هاتف : ٢٤٩٢٧٢٧ فاكس : ٢٤٠١١٧٥ البريد الإلكتروني : mrawdhah@hotmail.com ص.ب ٨٧٢٩٩ الرياض ١١٦٤٢

ردمك: ٩-٩١-٨١٣-٩٩٦٠

مطبعة النرجس - ت: ٢٣١٦٦٤٣ ف: ٢٣١٦٨٦٦